චක්‍රලේඛ අංකය:- 25/2011

මගේ අංකය: ඩබ්/08/බලපත්‍ර
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2011.12.05

සියළුම බන්ධනාගාර අධිකාරීන්/ සහකාර අධිකාරීන් වෙත,

## බලපත්‍ර මත සිරකරුවන් මුදාහැරීම

ඉහත කරුණට අදාලව නිකුත් කර ඇති මගේ අංකය: ඩබ්/08 හා 1992.09.01 දිනැති අංකය: 35/92 චක්‍රලේඛය මින් අවලංගු කරමි.

02. මින් ඉදිරියට පහත සඳහන් වර්ගීකරණය සහ කොන්දේසි වලට යටත්ව සිරකරුවන් බලපත්‍ර මත මුදාහැරීමට සලකා බැලීම සඳහා තෝරා ගැනීම කල යුතුයි. ඒ අනුව බලපත්‍ර මත මුදාහැරීම සලකා බැලීමේ සුදුසුකම් ලබන දිනය ගණනය කරනුයේ සාමාන්‍ය සමාව සහිතව නිදහස් වන දිනය පදනම් කරගෙනය.

03. අවුරුදු 03 ක් හෝ ඊට වැඩි සිරදඬුවම් ලැබූවන් මෙම ක්‍රමය යටතට ගැනෙන අතර ඔවුන් සාමාන්‍ය සමාව සහිත නිදහස් දිනයෙන් හරි අඩක් සම්පූර්ණ කරන දිනය බලපත්‍ර මත මුදාහැරීමට සුදුසුකම් ලබන දිනය විය යුතුයි.

04. මීට පෙර බලපත්‍ර මත මුදාහරින ලද සිරකරුවන් නැවත බන්ධනාගාර ගතවීමේදී නැවතත් බලපත්‍ර මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නුසුදුස්සන් වෙති.

05. මත්ද්‍රව්‍ය යටතට ගැනෙන ගංජා, අබිං හා නීති විරෝධී මත්පැන් යන චෝදනාවන්ට වරදකරුවන් පමණක් බලපත්‍ර මත මුදාහැරීමට සලකා බලන අතර, හෙරොයින්, හෂිස් හා වෙනත් මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් බලපත්‍ර ක්‍රමය යටතේ මින් ඉදිරියට මුදාහැරීමට සලකා බලනු නොලැබේ. ඔවුන් දැනටමත් ආරම්භ කර ඇති මත්ද්‍රව්‍ය නිවාරණ මධ්‍යස්ථාන වලට ප්‍රතිකාරාත්මක වැඩසටහන් සඳහා යොමු කෙරේ.

06. ස්ත්‍රී දූෂණ, ළමා අපචාර යන චෝදනා සඳහා දඬුවම් ලැබූවන් බලපත්‍ර මත මුදාහැරීමේදී ඔවුන්ගේ පූර්ව ක්‍රියා කලාපය, වරදේ අල්ප බව හෝ බරපතල කම, වරදට පොළඹවීම් සහ සමාජ ආකල්ප ගැඹුරින් සැලකිල්ලට ගෙන බලපත්‍ර මණ්ඩලය විසින් ඔවුන් මුදාහැරීම නිර්දේශ කිරීමට තිරණය කරනු ඇත.

07. බලපත්‍ර මත නිදහස් වීමට සුදුසුකම් ලබන සිරකරුවන්ගේ නාම ලේඛණය සුදුසුකම් ලබන දිනයට මාස 06 කට පෙර සිර ලියාපදිංචි කිරීමේ අංශයෙන් සකස් කර පිටපතක් සුභසාධක නිලධාරි වෙත සපයා මුල් පිටපත ලේකම්, බලපත්‍ර මණ්ඩලය වෙත එවිය යුතු අතර, මින් ඉදිරියට එම ලේඛණයේ පිටපතක් සිරකරුවන්ගේ දැනගැනීම සඳහා ද ප්‍රදර්ශනය කිරීමට ලියාපදිංචි ලිපිකරු අංශය විසින් ක්‍රියා කල යුතුය. එසේම බලපත්‍ර මත නිදහස් වීමට නිර්දේශ වුවන්ගේද, නිවාස නිවාඩු යැවීමට නිර්දේශ වුවන්ගේද විස්තර සිරකරුවන්ගේ දැනගැනීම සඳහා සහ අභියාචනා ඇත්නම් ඉදිරිපත් කිරීම සඳහා, ප්‍රදර්ශනය කිරීමට ක්‍රියා කල යුතුය.

08. සුභසාධක නිලධාරීන් විසින් මෙම කටයුතු වලට වඩාත් ප්‍රමුඛත්වයක් දිය යුතු අතර සමාජ වාර්තා ගොනු නියමිත දිනට බලපත්‍ර මණ්ඩලය වෙත ඉදිරිපත් කරන්නේදැයි අවධානයෙන් සිටීමට අධිකාරීවරුන් වගබලා ගත යුතු බවද මෙයින් දන්වමි.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්